# බුදු දහමේ ඉගැන්වෙන පාරිසරික විඥාණය.

කඩවත්ගම පියරථන හිමි.

ස්වභාව ධර්මය තුළ දක්නට ලැබෙන අන්‍යෝන්‍ය සම්බන්ධය අතිශයින් ම ශක්ති සම්පන්නය. ලෝකයේ පැවැත්ම සිදුවන්නේ මෙම බැඳීම් පදනම් කරගෙනය. බුදුරජාණන් වහන්සේ ඒ බව ලෝකයාට පෙන්වා දුන්හ. බුද්ධ දේශනාවෙහි ස්වාභාව ධර්මය කෙරෙහි කර ඇති ඉගැන්වීම ලෝකය විශ්මයට පත් කරවන සුළුය.

බුද්ධ දේශනාවන් අතර ඉතා උතුම් දේශනාවක් වශයෙන් පටිච්චසමුප්පාද ඉගැන්වීම පෙන්වා දිය හැකිය. එය මිනිසා පිළිබඳ යථාර්ථයත් භෞතික ලෝකයේ යථාර්ථයත් ප්‍රකට කරයි. මිනිසාගේ පැවැත්ම එක් එක් ධාතු කොටස්වල සහ විඤ්ඤාණික සම්බන්ධතාවය මත සිදුවෙන බව පෙන්වා දුන්හ. පඨවි, අපෝ, තෙජෝ, වායෝ, අකාශ යනාදි ධර්ම කොට්ඨාස වලින් ස්වභාව ධර්මය සකස් වී ඇති බවත් මේවා එකිනෙකට වෙන් නොවන සේ ඒකාබද්ධව පවත්නා බවත් පටිච්චසමුප්පාද න්‍යාය තුළ පෙන්වා දෙයි. සෑම සම්බන්ධයකටම අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් දකින්නට ලැබෙයි. එකක් තවත් එකක් නිසාවෙන් හෝ තවත් එකක් ආධාර කරගෙන පවත්නා බවත් බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. අන්‍යෝන්‍ය සම්බන්ධව තිබෙන්නා වූ විවිධ මූලධාතූන්වල කිසියම් එකක් විනාශය නිසා ඒ හා සම්බන්ධ අන් බොහෝ දේවලට ද විනාශය සිදුවෙන බව උන්වහන්සේ පෙන්වා දුන්හ. මෙම සංශ්ලේෂණ හා විශ්ලේශන ක්‍රමය මුලු බුද්ධ දේශනාව පුරාවටම පැහැදිලි කිරීමට උත්සාහ ගෙන ඇති බව පෙනී යයි.

අතීතයේ ජීවත් වූ මිනිසා පරිසරයේ ම කොටසක් ලෙසින් ජීවත් විය. ඔහු ස්වභාව ධර්මයත් සමඟ සමීපතම දිවි පෙවතක් ගෙවීය. ගස්වලට ගෞරව කළහ. ස්වභාව ධර්මය තුළ ජීවත් වූවා පමණක් නොව වෘකෂලතා, පර්වත, හිරු, සඳු ආදිය දේවත්වයට ආරෝපනය කරගෙන තම ආගමික චින්තනය ද ගොඩනගා ගත්හ. ප්‍රාග් බෞද්ධ ශ්‍රී ලංකාවේ ද වෘක්ෂ වන්දනාව පැවැතිනි.[1] ශ්‍රී ලංකාවේ පණ්ඩුකාභය රජ දවස කිසියම් යක්ෂයෙකුට රාජ්‍යයේ බටහිර දොරටුව අසල නුග රැකක් ද ව්‍යාධි දෙවියාට ද බටහිර වාසල අසල තල් රැකක්ද වාසය කිරීම සඳහා වෙන් කර දුන්නේ ය.[2] එම නිසා පසුකාලින මිනිසුන් ගස්වලට ඉතා ගෞරවනීය බවක් දැක්වූහ. වෘක්ෂ දේව සංකල්පය එම නිසා ඉතා



වැදගත් අදහසක් විය. ගසට අරක්ගත් දෙවියෙක් ඇතැයි සිතා ගසට අවශ්‍ය සත් උපකාර කළහ. ගස් විනාශ කිරීම තමාට හානිදායක දෙයක් ලෙස සැලකුහ. යම් විධියකින් ගසක් සිඳීමට අවශ්‍ය වුවහොත් ගසට අධිගෘහිත දෙවියන් ගසින් බස්සවා යාමට සැලැස් වූයේ ස්තෝත්‍ර සජ්ඣායනා කිරීමෙන්ය.[3] බුද්ධ දේශනාවල ද වෘකෂ වන්දනාව පිළිබඳ කරන ලද සඳහන් දැකගත හැකිය. බියට පත් වූ මිනිසා ගස්, පර්වත, ආරාම සරණ යන බව පෙන්වා දුන්හ.[4]

මිනිසා මිහිමත ජීවත්වන එකම ජීවියා නොවන බව බුද්ධ දේශනාව තුළ අවධාරණය කරයි. එහෙත් මිනිසත් බව ලැබූ එකම ජීවියා මිනිසා බව පෙන්වා දෙයි. ගණනය කළ නොහැකි තරම් විශාල ප්‍රාණීන් සංඛ්‍යාවක් මිහිමත ජීවත් වන බව බුද්ධ දේශනාවේ සඳහන් වෙයි.[5] මෙහිදි අවධාරණය කොට ඇත්තේ මිහිමඬල තුළ ජීවත්වෙන ජෛවීන්ගේ විවිධත්වයයි.

පෘථිවිය මත ජීවත්වෙන ඉතා කුඩා ජීවියාගේ පටන් සෑම ද්‍රව්‍යයකම අන්තර් සම්බන්ධයක් පෙන්නුම් කරන බව බෞද්ධ දර්ශනය පැහැදිලි කරයි. එසේ ම මිනිසා සහ පරිසරය අතර පවත්නාවූ අන්‍යෝන්‍ය සම්බන්ධතාව ද තර්කානුකූලව බුදුදහමේ පැහැදිලි කරයි. බුදු සමය විසින් සිදු කර ඇති උස්සම කාර්ය භාරය වන්නේ පරිසරය හා සමග ජීවත්වීමට මිනිසා හුරු පුරුදු කිරීමයි. මිනිසාට ඉතා මිත්‍රශීලි ආකල්පයකින් ජීව ලෝකය දෙස බැලීමට බුදුසමය මග කියා දෙයි.[6] ඇසට නොපෙනන සත්ත්වයාගේ පටන් ඉතා ලොකුම සත්ත්වයා දක්වා මෛත්‍රී දක්වන ලෙස බුදු සමය අවධාරණය කරයි. එසේ මිනිසා විසින් සතුන් නොමැරීමෙන් පමණක් නොව සියලු සතුන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරන ලෙස ද ඉල්ලා සිටියි.[7]

මිනිසා ජීවත් විය යුත්තේ පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂාවන පරිදි බව බුදු දහම අවධාරණය කරයි. සියලු ජීවි වස්තූන් මවක් තම එකම පුතු රැකගන්නාක් මෙන් රැකගත යුතු බව බුදු සමය මිනිසා දැනුවත් කරයි.[8]

මිනිසා තෘෂ්ණාව නිසා බොහෝ සම්පත් උපයා ගැනීමට වෙහෙස දරයි. සමහර මිනිස්සු ඉතා අවිචාරවත් ලෙස සමාජ විරෝධි ලෙස අන් අය පිළිබඳ නොසලකා සම්පත් පරිහරණය කරති. බුදුරජාණන් වහන්සේ සම්පත් පරිහරණය කිරීමේ දී ඒවා මැනවින් කළමනාකරණය කරගත යුතු ආකාරය පෙන්වා දුන්හ. දිනක් උන්වහන්සේ භික්ෂූන්ට තමා සතු සිවුර විවිධ අවස්ථාවලදී භාවිත කළ

යුතු අයුරු පෙන්වා දුන්හ. සිවුර පාවිච්චියට ගත නොහැකි සේ දිරා ගිය හොත් ඇඳ ඇතිරිල්ලක් ලෙස ගත යුතුය. එසේත් නොගත හැකි වුවහොත් මෙට්ටයට අණ්ඩ දැමූ කවරයක් ලෙස ද ඉන් පසු අත් පිස්නයක් ලෙස හෝ පාපිස්සක් ලෙස පරිහරණය කළ යුතුය. ඉන් පසු මැටි හා මිශ්‍ර කොට බිත්ති අලුත් වැඩියා කිරීමට යෙදිය යුතුය.[9]

බුදුරජාණන් වහන්සේ උතු නියාම, බීජ නියාම, ධම්ම නියාම වශයෙන් ලෝක ස්වභාව ධර්මය මත පවතින බව දේශනා කළහ. මේවා මිනිසාගේ හිතුමතේට නොගැලපෙන අන්දමින් වෙනස් නොකළ යුතු බවත් එසේ කළහොත් එය මිනිසාගේ ම පැවැත්මට ප්‍රබල අභියෝගයක් බවත් පෙන්වා දුන්හ. ස්වභාව ධර්මයට අනුව ජීවත් වීමට මේ අනුව බුදු දහම පෙන්වා දී ඇති බව සඳහන් කළ යුතුය.

බුදු දහම ලොව කිසිදු දේශනාවක සඳහන් නොවන අන්දමට ජීවී පරිසරය ආරක්ෂා කර ගැනීමට ප්‍රයත්න දරයි. ඒ බව පංචශීල ප්‍රතිපත්තියේ සඳහන් වන සියලු සතුන් නොමරන්න යන පළමු සික්‍ෂා පදයෙන් පැහැදිලි කර ඇත. බෞද්ධ සාහිත්‍ය තුළ දක්නට ලැබෙන විවිධ ජාතක කතා මෙන් ම ගාථාවන්ගෙන් ද පරිසරය වැස්ස, ගහකොළ පිළිබඳව බුදුදහම මොනතරම් දුරට අවධාරණය කර තිබේ දැයි එයින් පෙන්නුම් කරයි.

බුදුරජාණන් වහන්සේ තම ජිවිතයේ බොහෝ අවස්ථාවල ස්වභාවික පරිසරය තුළ ම වාසය කළහ. උන්වහන්සේගේ උප්පත්තිය, බුද්ධත්වය හා පිරිනිවන් පෑම යන වැදගත් කරුණක්ම සිදුවූයේ ස්වභාවික පරිසරයේ දීය. එසේ ම පළමු ධර්ම දේශනා පැවැත්වීම, සත්සතිය ගත කිරීම සියල්ලක්ම ස්වභාව ධර්මය තුළ ම සිදු වූහ.

බුද්ධ දේශනාවක් වන රුක්ඛ සූත්‍රය[10] පරිසරය පිළිබඳ වැදගත් යමක් පවසයි. එහි වනාන්තරය මිනිසාගේ පැවැත්ම බෙහෙවින් ඉවහල් වන බවත් නිරන්තරයෙන් මිනිසා වනාන්තරය ආරක්ෂා කර ගත යුතු බවත් එහි සඳහන් කරයි. ආධ්‍යාත්මික ගුණධර්ම දියුණු කර ගැනීමට මහන්සි ගන්නා වූ වනාන්තරය ස්වභාව ධර්මය ඉතා විශාල සම්පතක් බව ද පැහැදිලි කළහ.[11] ගස සියලු ජීවීන්ට අයිති පොදු වස්තුවක් බව ද එය විනාශ කර දැමීම මහත් ආත්මාර්ථකාමී ක්‍රියාවක් බව විනය පිටකයේ දී පෙන්වා දෙයි.[12]

බුදුරජාණන් වහන්සේගේ චරිතය තුළින් උන්වහන්සේගේ ධර්මය තුළින් උගන්වන ලද මෙම පරිසර හිතකාමී ආකල්පය බුදු බණ ඇසූ ජනතාව තුළ ද දකින්නට ලැබිණි. එම නිසා බුදු සමයෙන්



පෝෂණය ලත් මිනිසා පරිසරයට ආදරය කළා පමණක් නොව පරිසරය තම ජිවිතයේම කොටසක් ලෙස සැලකූහ. ගසකින් කඩා ගත් ඉදුණු පළතුරක් අනුභව කොට එහි ඇතුලේ ඇති බීජය විනාශ නොකොට පරිසරයට එකතු කළ යුතු බව උන්වහන්සේ පෙන්වා දුන්හ. බීජය විනාශ නොකරන ලෙස අවවාද කළහ.[13] උන්වහන්සේ එසේ කර ඇත්තේ වනාන්තරයේ ස්වභාවිකව සිදුවන ක්‍රියාදාමය හෙවත් ගස් රෝපණය වීම පවත්වාගෙන යාම සඳහාය. මෙම අදහස එදාට වඩා අදට වැදගත් වෙයි.

මිනිසා බැහැර කරන අපද්‍රව්‍ය නිල් තණ මතට හෝ ජලයට එක් නොකළ යුතු යැයි පවසා විනය නීති රීති පනවා ඇත්තේ පරිසරය පිරිසිදුව තබා ගැනීමේ වටිනාකම මහජනතාවට කියා දීම සඳහායි. නිසංසල පරිසරයේ සුන්දරත්වය නැති කරන අධික ශබ්දය මිනිස් මනස ව්‍යාකුලත්වයට පත් කරන බවත් පරිසරයේ ඇති ස්වභාවික නිසංසලතාවය ආරක්ෂා කරනගන්නා ලෙසත් උන්වහන්සේ පෙන්වා දුන්හ. දිනක් බුදුරජාණන් වහන්සේ අධික ලෙස ශබ්ද නැගූ භික්‍ෂු පිරිසක් ආරාමයෙන් එළවා දැමූහ.[14] එම ඉගැන්වීම් වලින් ස්වභාවික පරිසරයේ නිශ්චලතාවය ආරක්ෂා කර ගැනීමට උන්වහන්සේ දැක්වූ උනන්දුව පැහැදිලි වෙයි. එය ගුරු කොට ගත් තම ශ්‍රාවකයෝ ද ඒ අනුව තම දිවි පැවැත්ම සකස් කර ගත්හ. නිශ්ශබ්දතාවය බුදුරජාණන් වහන්සේ ඉතා උතුම් ගුණයක් කොට සැලකූහ.

තම රටේ රාජ්‍ය නායකයා ද අනිවාර්යෙන් ම බෞද්ධයෙකු විය යුතු බව වසර දහස් ගණනකට පෙර ලාංකික ජනතාව සිතූහ. රජු යනු බුද්ධ දේශනය රට තුළ ආඥාදායකයෙක් සහ නීතියෙන් ස්ථාපනය කරන්නා වූ පුද්ගලයාය. භික්ෂූන් වහන්සේලා රජු ධර්මයට අනුකූලව රාජ්‍ය කරන්නේ ද නැද්ද යන්න පිළිබඳ නිරන්තරයෙන් ම අවධියෙන් සිටියහ. ඒ නිසා රජතුමා මහ පොළොවේ මෙන්ම ස්වභාවික සම්පත්වල ද සියලු ජීවී අජීවී වස්තූන් වලද ආරක්ෂකයා බවට පත් විය.

ස්වභාවික සම්පත් අතර වෘකෂලතාවන්ට හිමිවන්නේ සුවිශේෂී තැනකි. මිනිසාගේ ජීව ශක්තිය පැවැත්මට උපකාරී වන ගසට බුදුරජාණන් වහන්නසේ දැක්වූයේ පුදුම සහගත ආකල්පයකි. තමන් වහන්සේට බුදු වීමට සෙවන දුන් බෝ රුකට දින හතක් තිස්සේ කෙළෙහි ගුණ සැලකීමට කටයුතු කළහ. මිනිසා ගස් කෙරෙහි මොනතරම් කෘතවේදි විය යුතුදැයි එයින් මනා කොට පෙන්වා දුන්හ. එසේ ම රුක්

රෝපණය, උද්‍යාන, වනගොමු, පැන් පොකුණු ඉදිකිරීම සැමදා පින් වැඩෙන පින්කම් ලෙස දේශනා කළහ.[15] ඒ සඳහා ජනතාව ද පුරුදු පුහුණු කළහ.

බුදුරජාණන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයේ දී[16] මිනිසා අධි තෘෂ්ණාව නිසා පරිසරයේ ඇති ස්වභාවික දේ අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමට පටන් ගත් බවත් එහි ප්‍රතිඵලය වශයෙන් මිනිසාගේ ජීවිතයට විශාල අභියෝගයක් එල්ල වූ ආකාරය මැනවින් පෙන්වා දුන්හ. දීර්ඝ ආයුෂයක් වැලඳූ මිනිසා ස්වභාව ධර්මය විනාශ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වසර දහය දක්වා ආයුෂ අඩු වූ බව පෙන්වා දුන්හ. මෙම උතුම් ඉගැන්වීමෙන් මිනිසාත් පරිසරයත් අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධයත් එය පලුදු වීමෙන් ඇතිවන විනාශයත් පිළිබඳ අවබෝධයක් ලබා දෙයි.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට භාවනා කිරීමට සුදුසු ම ස්ථානයක් වශයෙන් ස්වභාවික පරිසරය අනුදැන වදාළහ. එසේ ම බුදුරජාණන් වහන්සේ ද පරිසරයෙන් ලැබෙන උතුම් විරාගික අස්වාදය අගය කළහ.

''මහණෙනි, මට මෙවැනි අදහසක් පහළ විය. මේ භූමි භාගය අතිශයින්ම රමණීයයි. වන ලැහැබ අතිශයින්ම ප්‍රසාද ජනකය. සුදු වැලිතලා මතින් සිත්කළු නදිය ගලා බසියි. හාත්පස ගොදුරු ගම ද වෙයි.''[17]

මෙසේ බුදුරජාණන් වහන්සේ ස්වභාව සෞන්දර්යය විරාගික ලෙස වර්ණනා කරන ලද බොහෝ අවස්ථාවන් දැක ගත හැකිය. ධනිය ගෝපාල සූත්‍රයෙහි ද[18] වැස්ස පිළිබඳ එවැනි වර්ණනාවක් දැක ගත හැකිය. එය ලෝකයේ මෙතෙක් වැස්ස පිළිබඳ කෙරුණු කලාත්මක වර්ණනාවක් වශයෙන් සඳහන් කළ හැකිය.

බුදුරජාණන් වහන්සේ පමණක් නොව උන්වහන්සේගේ ශ්‍රාවකයන් ශ්‍රාවිකාවන් ද පරිසරයට ඇලුම් කළහ. මහරහත් තෙරුන් වහන්සේලා ස්වභාවික පරිසරය පිළිබඳ ප්‍රකාශ කළ අදහස් බෞද්ධ සාහිත්‍යයෙහි ථෙර ගාථා නමින් ද මහරහත් තෙරණින් වහන්සේලා පරිසරය පිළිබඳ ප්‍රකාශ කරන ලද අදහස් ථෙරී ගාථා නමින් ද වෙනම සංග්‍රහ මූලාශ්‍ර දෙකක් දැක ගත හැකිය. එය ලෝකයේ පළමු අංග සම්පූර්ණ විරාගික භාව ගීත මේ යැයි සඳහන් වෙයි. මෙම භාව ගීත ග්‍රන්ථ තුළ වසින වැස්සෙහි ගීතවත් බව, ගලන ගංගාවෙහි, කඳු උඩින් කඩා හැලෙන දොළ පහරෙහි සුන්දරත්වය වනයෙහි සිත්කළු බව



වර්ණනා කරන්නේ ස්වභාව ධර්මයේ ඇති වටිනාකම නිසාය. එසේ ම එය ආදර්ශයට ගත් ජනතාව ද ස්වභාවික දායාද අගය කළහ. සුරක්ෂිත කළහ. ඉදිරි පරපුරට, අනාගත ලෝකයට දායාද කළහ.

බෞද්ධ සාහිත්‍යයෙහි ජාතක පොතෙහි එන ව්‍යාඝ්‍ර ජාතකය[19] අපට කදිම අදහසක් පවසයි. එම කථාවෙහි දැක්වෙන ආකාරයට කැලයේ දරුණු ව්‍යාග්‍රයෙක් වාසය කරයි. එම ව්‍යාග්‍රයා කැලෑවෙන් පන්නා දැමීමට එක් දෙවියෙක් මහ බෝසතාණන් වහන්සේට යෝජනා කරයි. එවිට උන්වහන්සේ එය ප්‍රතික්ෂේප කරති. උන්වහන්සේගේ අදහස වන්නේ ව්‍යාග්‍රයා කැලෑවෙන් පන්නා දැමූ විට මිනිසුන් නොබියව කැලෑයට රිංගා තම අවශ්‍යතාවයන් වලට ද වඩා ඉවක් බවක් නොමැතිව කැලෑව විනාශ කරන බවයි. එම නිසා දරුණු ව්‍යාග්‍රයා එම කැලෑවෙහි ම වාසය කළ යුතු බව බෝධි සත්වයෝ පෙන්වා දුන්හ.

අතීතයේ ජීවත් වූ මිනිසුන්ට වඩා වර්තමානයෙහි ජීවත් වන මිනිසුන් අති විශාල වශයෙන් පරිසර විනාශයෙහි නියුක්තව සිටිති. මිනිසුන්ගෙන් තරම් අනිත් කිසිදු සත්ත්වයෙකුගෙන් පරිසරයට මෙතරම් විනාශයක් සිදු නොවේ. පරිසර විනාශයෙහි ප්‍රතිඵලය වශයෙන් අද බීමට සුදුසු ජලය සොයා ගැනීමට අපහසුය. වාසය කිරීමට දූෂිත නොවුනු පරිසරයක් සොයා ගැනීමට අපහසුය. කර්මාන්ත කරණයෙන් හා ප්ලාස්ටික් භාවිතයෙන් ස්වභාව ධර්මය පවා කම්පනයට පත් වී ඇති බවක් පෙනී යයි. එම නිසා පරිසර විනාශය මුලු මහත් සත්ත්ව සන්හතියේ ම පැවැත්මට ප්‍රබල අභියෝගයක් බව පෙන්වා දිය යුතුය. විද්‍යාඥයෝ පරිසර විනාශයෙහි ඇති භයානක කම වරින් වර ලොවට පෙන්වා දෙති. එම නිසා හැකි ඉක්මනින් ජීව අජීව පරිසරයෙහි පැවැත්මට පරිසරය ආරක්ෂා කරගැනීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. එය සිදු කළ හැකි වන්නේ මිනිසාට පමණි.

## ආන්තික සටහන්

[1] Geiger Wilhem 1960 Cultre of Ceylon in medival Time, Editer by Heinz Bechert page 209

[2] මහවංශය 1954 11, 88, 90 පිටුව 57

[3] භද්දසාල ජාතකය - පන්සිය පනස් ජාතක පොත

[4] බහුංවේ සරණං යන්ති - පබ්බතානි වනානිච
ආරාමරුක්ඛ චෙතියානි - මනුස්සාභය තජ්ජිතා
ධම්මපදය 14 - වග්ගය 10 ගාථාව

[5] Sutta Nipata Vol v.p. 143 - 152 P.T.S. London

[6] පොන්සේකා ලලිතා 1999 අතීත රජදරුවන්ගේ පරිසර ප්‍රතිපත්තිය, පිටුව 68, ග්ලොබ් ප්‍රින්ටස් වර්කස්, කොළඹ 10

[7] මෙත්ත සූත්‍රය, ඛුද්දකපාඨ 1960 පිටුව 12 P.T.S. London

[8] මෙත්ත සූත්‍රය, ඛුද්දකපාඨ 1960 පිටුව 12 P.T.S. London

[9] Vinaya Pitakaya Vol I☞ page 291 P.T.S. Editer London

[10] සුත්ත නිපාතය 265 පිටුව P.T.S.

[11] මජ්ඣිම නිකාය I 118 පිටුව P.T.S.

[12] මහාවග්ග පාලිය IV 105 පිටුව P.T.S.

[13] සංයුක්ත නිකාය I 46 පිටුව P.T.S.

[14] මජ්ඣිම නිකාය I 457 පිටුව P.T.S.

[15] සංයුක්ත නිකාය, වනරෝප සූත්‍රය VOl I 33 පිටුව P.T.S.

[16] දීඝ නිකාය අග්ගඤ්ඤ සූත්‍රය P.T.S.

[17] මජ්ඣිම නිකාය අරිය පරියේෂණ සූත්‍රය 406 පිටුව ත්‍රි.බු.ජ.ග්‍ර.මා.



[18] සුත්ත නිපාතය ධනිය සූත්‍රය පිටුව P.T.S. ත්‍රි. බු. ජ.ග්‍ර. මා. London

[19] ව්‍යාග්‍ර ජාතකය පිටුව 271 පන්සිය පනස් ජාතක පොත ත්‍රි. බු. ජ. ග්‍ර. මා.